**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 16/93**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1993.08.06 වෙනි දින

සියළුම ලේකම්වරුන් වෙත,

**<u>සහකාර ලේකම්වරුන් ( ශ්‍රී ලං.ප.සේ. නොවන ) සේවක නියෝජිතයන්</u>**

1979 ජූනි 14 දිනැති අංක 315 සහ 1979 ඔක්තෝබර් 23 දිනැති අංක 331 ආයතන චක්‍රලේඛ ලිපි වලටද, 1986 ජූනි 24 දිනැති අංක 330 සහ 1986 ජූලි 30 දිනැති අංක 338 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලටද ඔබගේ අවධානය යොමු කෙරේ.

02. 1987 දෙසැම්බර් 11 දිනැති අංක 387 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ දක්වෙන රු. 55,200 - 7 x 2400 - 72,000 (ආර්-6-1) වැටුප් පරිමාණය, වසර 5 ක සතුටුදායක සේවා කාලයක් ඇති සහ ශ්‍රී ලං.ප.සේ. II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන 2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වී ඇති / නිදහස් කරනු ලැබ සිටින සහකාර ලේකම්වරුන් (ශ්‍රී ලං.ප.සේ. නොවන ) සේවක නියෝජිතයන් සඳහා, ඔවුන් වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දින සිට අදාල වනු ඇත.

03. 1992 දෙසැම්බර් 24 දිනැති අංක 37/92 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ දක්වෙන එස්-6-1 වැටුප් පරිමාණයට, 1993 ජනවාරි 01 දින සිට මෙම සහකාර ලේකම්වරුන් හිමිකම් ලබනු ඇත.

අ කලේ / එම්.ඩී.ඩී. පීරිස්
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය